(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 182.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 මැයි මස 09 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0851/’10

1.

ගරු රවී කරුණානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවල දේශීය සහල් පරිභෝජනය කොපමණද;

(ii) 2011 සහ 2012 වර්ෂවල පරිභෝජනය සඳහා අවශ්‍යවේ යැයි ගණන් බලා ඇති සහල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 පෙබරවාරි මස සහල් මෙට්‍රික් ටොන් 100,000 ආනයනය කළ රජයේ ආයතනයන්හි නම් කවරේද;

(ii) ඉහත ආනයනයන් සඳහා මුදල් ලැබුනු මූලාශ්‍ර කවරේද;

(iii) මෙසේ ආනයනය කරන ලද සහල්වල ආනයනික මිල, විකුණුම් මිල, අලෙවි කරන ලද ප්‍රමාණය සහ ගබඩා කර තිබෙන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑමයක මිල රු. 65/= ට වඩා වැඩියෙන් තිබියදී, මෙසේ ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 30,000ක් පමණ එක් කිලෝග්‍රෑමයක් රු. 31/= බැගින් 2010 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික අංශයට අලෙවි කර ඇති බවත්,

(ii) මෙම සහල් දේශීය වෙළෙඳපොළෙහි අලෙවි නොකරන ලෙසට රජය අවධාරණය කර තිබුණද, පෞද්ගලික වෙළෙඳුන් ඒවා දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) මෙසේ සහල් අලෙවි කළ පෞද්ගලික වෙළෙඳුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1273/’11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද කඳුරුවාන තේ කම්හල වර්ෂ හයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා ඇති බවත්;

(ii) ජාතික සම්පතක් වන එම කර්මාන්ත ශාලාව ප්‍රයෝජනයට නොගෙන අත්හැර තිබීමෙන් ජාතික ආර්ථිකයට විශාල පාඩුවක් සිදු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තේ කම්හල ඉදිකිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීමට හේතු කවරේද;

(iii) තේ කම්හලේ නිෂ්පාදන කටයුතු කඩිනමින් ආරම්භ කොට ප්‍රදේශයේ තේ වගාකරුවන්ගේ අමු තේ දළු මිලදී ගැනීමේ ක්‍රමවේදයක් සකසන්නේද;

(iv) නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1683/'11

3\.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1728/'11

4\.

ගරු අනුර දිසානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම නිසා නිවාස අහිමි වූ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට වන්දි මුදල් ලබා දුන්නේද;

(iii) එසේ නම්, එක් එක් අය වෙනුවෙන් ලබා දුන් වන්දි මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ධීවර වරාය ඉදිකිරීමේදී නිවාස අහිමිවූවන් සඳහා නිවාස ඉදිකර දී තිබේද;

(ii) එසේ නම්, එම නිවාස ඉදිකරනු ලැබූ සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(iv) එක් එක් නිවාසයේ ඉඩ ප්‍රමාණය හා ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(v) ඉදිකරන ලද නිවාස පුපුරායෑම් හා ගිලා බැසීම්වලට ලක්ව තිබේද;

(vi) එසේ නම්, එම තත්වයන් නිවැරදි කිරීම සඳහා යොදන පිළියම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1775/'11

5\.

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල මහමෝදර රෝහලේ,

(i) ක්‍රියාත්මක වාට්ටු හා අනෙකුත් අංශ කවරේද;

(ii) සුනාමි ව්‍යසනයේදී සිදුවූ හානි කවරේද;

(iii) රෝගීන්ට ප්‍රතිකාර කිරීමට සුදුසු තත්ත්වයක් තිබේද;

(iv) වර්තමාන ස්ථානයේ වෙනසක් කිරීමට තීරණයකර තිබේ නම්, ඊට අදාළව ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කරාපිටිය රෝහල ආසන්නයේ මාතෘ හා ළමා රෝහලක් ඉදිකිරීම අරඹා තිබේ නම්, එය ආරම්භකළ දිනය, ඊට ඇස්තමේන්තුගත මුදල හා වත්මන් ප්‍රගතිය;

(ii) රෝහල් සැලැස්ම අනුව එහි අඩංගු අංශ පිළිබඳ විස්තර;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම රෝහල ඉදිකිරීමට,

(i) මුදල් ලබාදුන් හෝ ලබාදීමට අපේක්ෂිත පුද්ගලයන් හෝ ආයතන;

(ii) දැනට ලබා දී ඇති මුදල;

(iii) මුදල් වැය කර ඇති ආකාරය;

(iv) වැය නොකර ඉතිරිවූ මුදල සහ එම මුදල් යෙදවූ කාර්යය;

(v) දැනට රජයේ ප්‍රතිපාදන වෙන්කර තිබේ නම්, එම මුදල;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම රෝහල ඉදිකිරීමේදී මූල්‍ය වංචාවක් හෝ දූෂණයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළව පරීක්ෂණයක් පවත්වා නිසි ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1909/'11

6\.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විදේශ රැකියා සඳහා මැද පෙරදිග රටවලට යන බොහෝ ශ්‍රමිකයන්ට එම රටවල ක්‍රියාත්මක වන ෂරියා නීතිය සහ අනෙකුත් නීති රීති පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බවත්;

(ii) එම හේතුව නිසා විදේශ රැකියාවල යෙදීමේදී ඔවුන්ට විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මැදපෙරදිග රටවල නීති රීති පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් එම රටවල නීතිය යටතේ වරදකරුවන් වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්හට නීති ආධාර ලබා ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දී එම ශ්‍රමිකයන්ට ඇතිවන ගැටලු මගහැරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1916/'11

7.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් අතරින් "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති පාසල් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක/දොඹගොඩ සීලරතන මහා විද්‍යාලය "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගැනීමට සුදුසු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම පාසල එකී ව්‍යාපෘතිය සඳහා ඇතුළත් කර ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1927/'11

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අලුත්ගම සිට ගාල්ල දක්වා දිවෙන දුම්රිය මාර්ගය අලුත්වැඩියා කිරීමේ කටයුතු භාර දී ඇති ආයතනයේ නම කුමක්ද;

(ii) එකී ආයතනය අයත් රට කුමක්ද;

(iii) එම අලුත්වැඩියා කටයුතු සඳහා වෙන් කර ඇති ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) එකී දුම්රිය මාර්ගයේ අලුත්වැඩියා කටයුතු අවසන් කරන දිනය කවරේද;

(v) එම දුම්රිය මාර්ගයේ සංවර්ධන කටයුතු අවසන් කිරීමේදී වැය වේ යැයි අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලුත්ගම සිට ගාල්ල දක්වා දුම්රිය මාර්ග අලුත්වැඩියා කොන්ත්‍රාත්තුව ලබා දීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලැබුණු ටෙන්ඩර් ඉල්ලුම් පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1643/'11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි බඳුරාවල රජයේ පාසල වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට එම පාසලට අයත් රුපියල් ලක්ෂ ගණනාවක් වටිනා ගොඩනැගිලි දිරාපත් වෙමින් පවතින බවත්;

(iii) ප්‍රදේශයේ දරුදැරියන් සඳහා නැවත පාසල විවෘතකර දෙන මෙන් ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල විවෘත නොකරන්නේ නම්, වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

(iii) එම පාසල යොදා ගැනීමට අපේක්ෂිත ආර්ථික කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1687/'11

10.
ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1711/'11

11.
ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගුවන් තොටුපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලාංකික ගුවන් සේවා නීතියට අනුව දැනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලියාපදිංචි කර ඇති එක් එක් ගුවන් යානයේ නිෂ්පාදිත වර්ෂය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2006 සිට 2011 දක්වා ලියාපදිංචි කළ ගුවන් සේවා මගින් රජය විසින් උපයන ලද ආදායම කොපමණද;

(ඇ) වර්ෂ 2006 සිට 2011 දක්වා ශ්‍රී ලංකාවේ ඇති ගුවන් තොටුපළවල් හරහා,

(i) ඇතුළු වූ හා පිට වූ මගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහා මෙහා යැවූ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්ෂ 2006 සිට 2011 දක්වා එම ගුවන්තොටුපළවල් මගින් රජය විසින් උපයන ලද ආදායම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1928/'11

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා මගනැගුම යන්ත්‍රෝපකරණ ආයතනයේ සභාපති තනතුරේ සේවය කළ අයගේ නම් කවරේද;

(ii) එම එක් එක් සභාපතිවරයාගේ සේවා කාලය, ඔවුන් ලැබූ වැටුප් සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මගනැගුම යන්ත්‍රෝපකරණ ආයතනයේ වර්ෂ 2005 සිට මේ දක්වා සේවය කළ ස්ථිර සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනයෙන් ඉවත් කළ ස්ථිර සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉවත් කළ ස්ථිර සේවකයින්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

(iv) එම සේවකයින් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා ඉහත ආයතනයේ සේවය කළ අනියම් සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් සේවය ස්ථිර කරන ලද සහ සේවයෙන් ඉවත් කරන ලද සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1644/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ පිහිටි නාගොඩ ආනන්ද කණිෂ්ඨ විද්‍යාලය වැසී ගොස් වර්ෂ හයක් පමණ ගතවී ඇති බවත්;

(ii) මේ වන විට, පාසල සතු සියලු ගොඩනැගිලි වල් බිහි වී, දිරාපත් වෙමින් පවතින බවත්;

(iii) නගරයේ පවතින ජනප්‍රිය පාසල්වල තදබදය අඩු කිරීම සඳහා මෙම පාසල නැවත විවෘත කරන ලෙස ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කරන්නේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(ii) නොඑසේ නම්, පාසලේ සම්පත් වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

(iv) එම ආර්ථික කටයුත්ත ආරම්භ කිරීම සඳහා ගතවන කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1712/'11

14\.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී නිසි ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව විවිධ අරමුණු සඳහා ඉඩම් භාවිතා කරන අය වෙත ලබා දෙන ලද පර්චස් 50 හෝ ඊට වැඩි ඉඩම් මොනවාද;

(ii) එම ඉඩම් භාවිතා කරන අය වෙත, එම ඉඩම් ලබා දීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) (i) අනුව දෙන ලද ඉඩම් භාවිතා කිරීම හේතුවෙන් උත්පාදනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙන ලද ඉඩම් භාවිතා කිරීම හේතුවෙන් මෙරටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(v) ඉහත කී ඉඩම් දීමේ ක්‍රියාවලියේදී ලබා දුන් බදු සහනවල වටිනාකම කොපමණද;

(vi) මෙම ඉඩම් ගනුදෙනු සම්බන්ධයෙන් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1930/'11

15\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මගනැගුම යන්ත්‍රෝපකරණ සමාගම පිහිටවනු ලැබූ දිනය කවරේද;

(ii) එම සමාගමේ කොටස් හිමියන් කවුරුන්ද;

(iii) එක් එක් කොටස් හිමියා සතු කොටස් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මගනැගුම යන්ත්‍රෝපකරණ සමාගම ආරම්භ කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියෙන් හෝ එවකට එහි පාලිත සමාගමේ හා ආශ්‍රිත සමාගම්වලින් යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ප්‍රාග්ධනයන් ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් දේ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 පෙබරවාරි 28 දිනැති අංක 1747/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.05.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*9.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

10.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**